258, එම්. වින්සන්ට් පෙරේරා මාවත
කොළඹ 14
0114700800

# යුනිලිවර් ශ්‍රී ලංකා සමාගම Learning to Make a Difference වැඩසටහන මඟින් පාසල් සිසුන් 7000 කට වැඩි ගණනකට සහාය වෙයි

*e-learning වෙනුවෙන් ආයෝජනය කරන සෑම පැයක් සමඟින් දරුවන්ට පාසල් උපකරණසඳහා මූල්‍යාධාරසපයයි*

**දෙසැම්බර් 26, කොළඹ -** යුනිලිවර් ශ්‍රී ලංකා සමාගම සිය සේවක මඬුල්ල මාර්ගගත ඉගෙනුම් ක්‍රියාවල යෙදෙන සෑම මිනිස් පැයක්ම මුදල් බවට පරිවර්තනය කරමින් තම සමාගමට සම්බන්ධ සෞභාග්‍යා ව්‍යවසායිකාවන්ගේ දරුවන්ගේ අධ්‍යාපනයට අත්වැලක් සපයන සිය 'Learning to Make a Difference' වැඩසටහන සාර්ථකව නවවැනි වසරටත් දියත්කොට ඇත. මෙමඟින් එම දරුවන්ට සිය අධ්‍යාපන කටයුතු සඳහා අත්‍යවශ්‍ය පාසල් උපකරණ ලබාදීම සඳහා මූල්‍යාධාර සපයනු ලබයි.

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය සමඟ සහයෝගයෙන් ක්‍රියාත්මක පැරණිතම රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරීත්වයක් ලෙස සෞභාග්‍යා වැඩසටහන දැක්විය හැකිය. එමඟින් යුනිලිවර් නිෂ්පාදන ඍජුවම පාරිභෝගිකයා අතරට ගෙන යාමේ තානාපතිවරියන් බවට පත් කර එතුළින් කාන්තාවන්ට තිරසාර ජීවනෝපායක් උපයාගැනීමට උපකාර කරනු ලබයි. 2003 වසරේ දී එඩිතර කාන්තාවන් පස් දෙනෙකු සමඟින් ආරම්භ කළ මෙම වැඩසටහන අද වන විට සෞභාග්‍යා ව්‍යවසායකයින් 5,000ක් දක්වා ව්‍යාප්තව ඇත.

'Learning to Make a Difference'වැඩසටහන 2013 වසරේ සිට 7000 කට අධික පාසල් සිසුන්ගේ ජීවිත කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කිරීමට සමත්ව ඇත්තේ ඔවුන්ගේ අනාගත බලාපොරොත්තු මල්ඵල ගන්වමිනි. මෙම වැඩසටහන තුළින් සෑම දරුවකුටම පාසල් බෑගයක්, සටහන් පොත්, පාට පැන්සල්, පැන්සල් පෙට්ටි, කවකටු පෙට්ටි ආදියද ලබා දේ. 2021 වසරේදී යුනිලිවර් සාමාජිකයින් ඔවුන්ගේ ශාරීරික යෝග්‍යතා පැය ද මෙම කර්තව්‍යය සඳහා පරිවර්තනය කිරීමෙන් සිය දායකත්වය දැක්වීය.
මේ සම්බන්ධයෙන් අදහස් දැක්වූ යුනිලිවර් ශ්‍රී ලංකා සමාගමේ මානව සම්පත් අධ්‍යක්ෂිකා අනන්‍යා සහාර්වල් මහත්මිය සඳහන් කළේ ''ඉගෙන ගැනීමට ඇති හොඳම ක්‍රමය අන් අයට ඉගෙන ගැනීමට උපකාර කිරීම බව අපගේ විශ්වාසයයි. අපගේ බොහෝ සාමාජිකයන් පවසා සිටියේ ඔවුන් මාර්ගගතඉගෙනුම් පාඨමාලාවන්හි නිරතවීමට කාලය ගත කරනු ලැබුවේ එය තවත් දරුවෙකුගේ ජීවිතයට වෙනසක් ඇති කරන නිසා බවයි. අපගේ 'ඔබ ඉගෙන ගන්නා විට ඔවුන්ද ඉගෙන ගනියි' යන සංකල්පය අපගේ දැනුම, කුසලතා මුවහත් කර ගැනීමට මෙන්ම අනාගතයට උචිත පරිදි හැඩගැසීමට අපගේම ස්වයං ඉගෙනුම්, ඩිජිටල් හා වර්ධනීය මාවතක ආයෝජනය කිරීමට අපට අවස්ථාව ලබා දී තිබෙනවා'' යනුවෙනි.

මෙම පරිත්‍යාගයන් වෙනුවෙන් යුනිලිවර්හි මාර්ගගත ඉගෙනුම් උපයෝග මඟින්තම පුද්ගලික සහ ව්‍යාපාර වර්ධනයට දායක වන ඕනෑම පාඨමාලා ගණනක් සම්පූර්ණ කිරීමට යුනිලිවර් සාමාජිකයන්ට අවස්ථාව ඇත. මෙය 2025 වසර වන විට අනාගතයට ගැළපෙන හැකියාවන් සහිත සේවකයින් නිපුණත්වයට පත් කිරීම හා හැකියාවන්ගෙන් ඉහළ නැංවීම සඳහා වන සමාගමේ ගෝලීය ඉලක්කයන් මත පදනම් වී ඇති අතර එය කඩිනමින් ඉටු කිරීම යුනිලිවර් ශ්‍රී ලංකා සමාගමේ අරමුණ වී ඇත.

එසේම යුනිලිවර් සෞභාග්‍යා වැඩසටහන මඟින් 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව, අ.පො.ස සා/පෙළ, උ/පෙළ වැනි විවිධ අධ්‍යාපනික සංධිස්ථානයන්හි දස්කම් දැක්වූ ක්‍රියාකාරී සෞභාග්‍යා ව්‍යවසායකයින්ගේ පවුල් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමටද කටයුතු කර ඇත. මෙම වැඩසටහන මඟින් කලා හා ක්‍රීඩා ක්ෂෙත්‍රයන්හි සුවිශේෂී දක්ෂතා දක්වන සිසුන් හඳුනා ගැනීමටද කටයුතු කර ඇත. මේ වන විට

සෞභාග්‍යා වැඩසටහන තුළින් ශිෂ්‍යත්ව 680ක් පමණ ප්‍රදානය කර ඇති අතර ඉන් දරුවන් 200කට අධික සංඛ්‍යාවක් තම අධ්‍යාපනික ගමන සාර්ථක කර ගනිමින් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලයන්ට හා වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයන් වෙත ඇතුළු වීමට අවස්ථාව උදාකර ගෙන ඇත.

~අවසන්~